# ස්වභාවික උරුම සංචාරක ආකර්ෂණයක් ලෙස ලිප්ටන්ගේ අසුන ස්ථානය ප්‍රවර්ධනය කිරීමෙහිලා පවතින විභවතා හා සංරෝධක පිළිබඳ අධ්‍යනයක් (බදුල්ල දිස්ත්‍රික්කයේ දඹේතැන්න ප්‍රදේශය ආශ්‍රිත)

ඩබ්.ඩී ඉෂාරා සඳකුමරි විතානගේ*

ස්වභාවික උරුමය යනු ඉස්මතු වී පෙනෙන භෞතික, ජෛව විද්‍යාත්මක හා භූ විද්‍යාත්මක නිමැවුම් වඳවී යාමේ තර්ජනයට මුහුණ දී ඇති සත්ත්ව හා ශාක,පරිසර ප්‍රදේශ, විද්‍යාත්මක සංරක්ෂණ හෝ සෞන්දර්යය අගයක් ඇති භූමි ප්‍රදේශයක් ස්වභාවික උරුම වේ. ස්වභාවික උරුමයන් කරා සංචාරකයින් ගෙන්වා ගැනීමට නම් ඒවා නිර්මාණශීලී ලෙස භාවිතයට ගැනීමට නිසි ක්‍රමවේදයක් සැකසීම සිදු කළ යුතුය. බදුල්ල දිස්ත්‍රික්කයේ හපුතලේ ප්‍රදේශයේ දඹේතැන්න තේ වතුයායේ පිහිටි ලිප්ටන්ගේ අසුන යන ස්වභාවික උරුමය සංචාරක ආකර්ෂණයක් ලෙස ප්‍රවර්ධනය කිරීමෙහිලා පවතින විභවතා හා සංරෝධක හඳුනාගැනීම මෙහි අධ්‍යයන අරමුණ වේ. මෙම සිද්ධි අධ්‍යනයේදී ප්‍රාථමික දත්ත ලබාගැනීම සඳහා සම්මුඛ සාකච්ඡා හරහා දත්ත රැස්කිරීම සහ ද්විතියික දත්ත ලබාගැනීම සඳහා සඟරා අධ්‍යයනයක් ද සිදු කරන ලදී. ලිප්ටන්ගේ අසුනේ සිට අවට පරිසරය නරඹන විට මනස්කාන්ත දර්ශනයක් නැරඹීමට ලැබීම සංචාරකයින්ට දුර්ලභ අත්දැකීමක් වේ. මනස්කාන්ත දර්ශනීය පරිසරයක කඳුගැටයක නිර්මාණය කර ඇති ලිප්ටන්ගේ අසුන නම් ස්ථානය සංචාරකයින්ට සුවදායී නැරඹුමකි. පාපැදි ධාවනය, අවට නරඹමින් ඇවිද යාම, ප්‍රජා මූල සංචරණය, සංචාරකයින්ට අත්දැකීම් ලබාදීමට සමත් වේ. දඹේතැන්න තේ වතුයායේ තේ දළු නෙළීමට ඒ අත්දැකීම විඳගැනීමට සංචාරකයෝ රුචියක් දක්වති. මේ ලිප්ටන්ගේ අසුන ස්ථානය රැකගැනීම අප සතු යුතුකමකි.

ප්‍රමුඛ පද - ස්වභාවික උරුමය, ලිප්ටන්ගේ අසුන, සංචාරක ආකර්ෂණය, සංචාරකයා

* පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැළණිය විශ්වවිද්‍යාලය, ishara.sandakumari@gmail.com